# කොසෝවෝවෙන් පාඩම්

කොසෝවෝ පාර්ලිමේන්තුව ඒකපාක්ෂික ව නිදහස් රාජ්‍යයක් ප්‍රකාශ කර ඇත. මේ ලිපිය ලියන මොහොත වන විට රුසියාව, සර්බියාව හා ශ්‍රී ලංකාව ඒ පිළිබඳ තම විරෝධය පළකර ඇති අතර ඇමරිකන් එක්සත් ජනපදය කොසෝවෝව නව රාජ්‍යයක් ලෙස පිළිගෙන ඇත. අද හෙට ම බ්‍රිතානිය, ප්‍රංශය හා ජර්මනිය ද ඒ නව රාජ්‍යයක් ලෙස පිළිගැනීමට නියමිත ය. යුරෝපා සංගමයේ රටවල් 27න් 22ක්ම වැඩිකල් නොගොස් කොසෝවෝව පිළිගනු ඇතැයි බලාපොරොත්තු වෙයි. බෙදුම්වාදී ව්‍යාපාර පවතින බටහිර හා දකුණු යුරෝපීය රටවලට පමණක් කොසෝවෝව පිළිගැනීම අසීරු කටයුත්තක් වනු ඇත.

කොසෝවෝහි ජනගහනයෙන් සියයට අනුවක් පමණ ජනවර්ගයක් ලෙස ගතහොත් ඇල්බේනියානුවෝ වෙති. ආගමින් ඔවුහු මුස්ලිම් වෙති. ඉතිරි පිරිස ජනවර්ගයක් ලෙස සර්බියානුවෝ ද ආගමින් ග්‍රීක ඔතොඩොක්ස් ක්‍රිස්තියානිහු ද (නැගෙනහිර යුරෝපයේ ප්‍රචලිත වූ ග්‍රීක ඔතෝඩොක්ස් සංස්කෘතියෙහි ආගම) වෙති. රටක් ලෙස ගතහොත් 1912 පමණ සිට කොසෝවෝව සර්බියාවේ ප්‍රාන්තයක් වෙයි. ඊනියා දෙවැනි ලෝක යුද්ධයෙන් පසුව රතු හමුදාවේ මැදිහත්වීමෙන් සර්බියාව යුගෝස්ලේවියානු සන්ධීය හෙවත් ෆෙඩරල් රාජ්‍යයේ කොටසක් බවට පත්විය.

සෝවියට් දේශයේ කඩාවැටීමෙන් පසුව නැගෙනහිර යුරෝපීය කොමියුනිස්ට් රාජ්‍ය ඊනියා සමාජවාදයෙන් ධනවාදී බවටත් ඇතැම් සන්ධීය රාජ්‍ය කැබලිවීමටත් පටන්ගත්තේ ය. මේ ක්‍රියාදාමය මුලින් ම ඇතිවුයේ වැවෙන්සාගේ නායකත්වයෙන් පෝලන්තයේ යැයි කිවහැකි ය. පෝලන්තය හදිසියේ ම ධනවාදය දෙසට ඇදී ගියා නො වෙයි. එහි දී වැවෙන්සා ඉදිරියට ගැනීමට ඇමරිකන් එක්සත් ජනපදයේ පමණක් නොව අද යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට සේවය කරන පාප් වහන්සේ ගේ ද ක්‍රියාකාරීත්වය බලපෑවේ ය. එදා පාප්වහන්සේ පෝලන්ත ජාතිකයකු වීම ද පෝලන්තය කතෝලික වීම ද එහි දී වැදගත් සාධක විය. කොසෝවෝහි වෙනම රාජ්‍යයක් බිහිකිරීම පෝලන්තයේ ඇති වූ ක්‍රියාදාමයේ අළුත්ම පුරුක වෙයි.

මේ ක්‍රියාදාමය කොසෝවෝවෙන් අවසන් නො වෙයි. ස්ලැව් ජනවාර්ගිකයන් හා ස්ලැව් ඔතෝඩොක්ස් ක්‍රිස්තියානි සංස්කෘතිය දුර්වල කර හැකිනම් නැතිකිරීමට බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඇති අවශ්‍යතාව විසින් මේ ක්‍රියාදාමය තවදුරටත් ඉදිරියට ගෙන යනු ඇත. විසිවැනි සියවස නමින් යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙහි හැඳින්වෙන සියවසෙහි යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට හා ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයට පළමු ප්‍රහාරය එල්ල වුයේ කතෝලික චින්තනයෙන් බිහි වූ මාක්ස්වාදය ගුරු කොට ගත් ස්ලැව් ජනවර්ගයට අයත් ඔතෝඩොක්ස් සංස්කෘතියෙහි රුසියානුවන්ගෙනි. (පැරඩයිමය හෙවත් සුසමාදර්ශය ගැන මෙලෝ වැටහීමක් නැති මෙරට ඊනියා ප්‍රබුද්ධයනට එයට වඩා ගැඹුරු සංකල්පයක් වූ චින්තනය යන්න තේරුම් ගතහැකි යැයි මම නො සිතමි.) ලෙනින් මාක්ස්වාදය සංශෝධනය කර (මේ සංශෝධනය මාක්ස්වාදයේ දරිද්‍රතාවය පොතෙහි විස්තර කෙරී ඇත. මේ පොත සහ තවත් පොත් කිහිපයක් චින්තන පර්ෂදයෙහි කාලය වෙබ් අඩවියෙහි - ඪබ්ලිව්ඪබ්ලිව්ඪබ්ලිව්. කාලය.ඕරග් - අඩවිගත කිරීමට බලාපොරොත්තු වෙමු.) එය රුසියන් ස්ලැව් ඔතොඩොක්ස් සංස්කෘතියට අවශෝෂණය කෙළේ ය. යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට දෙවැනි ප්‍රහාරය එල්ල වුයේ කතෝලික චින්තනයෙන් ම බිහි වූ හිට්ලර්ගේ ෆැසිස්ට්වාදයෙනි. ඒ සංස්කෘතියට තුන්වැනි ප්‍රහාරය එල්ල වන්නේ මුස්ලිම් සංස්කෘතියෙනි.

යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය හිට්ලර් පරාජයකිරීම සඳහා සෝවියට් රාජ්‍යයෙහි ඔතෝඩොක්ස් සංස්කෘතිය සමග තාවකාලික මිත්‍රත්වයකට එළඹියේ ය. ඉන්පසු ඊනියා සීතල යුද්ධය ඔස්සේ සෝවියට් රාජ්‍යය හා එහි අනුගාමික රාජ්‍යය නැතිකිරීමට සියළු වෙර දැරී ය. අද වන විට මේ උත්සාහ බොහෝමයක් එලදරා ඇත. එහෙත් ලෝකයේ දැනට විහි වී ඇති පීඩාකාරී ම ඒකාධිකාරී ම ප්‍රජාතන්ත්‍ර විරෝධී ම සංස්කෘතිය වන යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය සැහීමකට පත්වන්නේ ලෝකයෙන් අනෙක් සියළු සංස්කෘතීන් අතුගා දැමූ දිනක ය. අද එක් අතකින් මුස්ලිම් සංස්කෘතියට එරෙහිව ඉරාකයේ ඉරානයේ ඇෆ්ගනිස්ථානයේ පලස්තීනයේ යුද වැදී සිටින යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය අනෙක් අතින් නැගෙනහිර යුරෝපීය ස්ලැව් ඔතොඩොක්ස් සංස්කෘතිය නැතිකිරීම සඳහා මුස්ලිම් සංස්කෘතියට ආධාර කරයි. ලංකාවේ දී යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතිය සිංහල ථෙරවාදී සංස්කෘතියට එරෙහිව

© Prof. Nalin De Silva

ප්‍රභාකරන්ගේ හා තවත් අයගේ දෙමළ ජාතිවාදී දේශපාලනය රැගත් හින්දු සංස්කෘතියක් යොදා ගනියි. දැනටමත් ඇතිකරගෙන තිබෙන තම සංස්කෘතික ආධිපත්‍යය යොදාගනිමින් අනෙක් සංස්කෘතීන් නැතිකිරීමට, ඒ බැරි නම් ඒවා තව තවත් දුර්වලකිරීමට ඒ අනෙක් සංස්කෘතීන් එකිනෙකට විරුද්ධව යොදාගැනීමෙහි ලා යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියට ඇත්තේ මනා පරිචයකි.

කොසෝවෝව වෙන ම රාජ්‍යයක් ලෙස ප්‍රකාශකිරීම එක්සත් ජාතීන්ගේ රීතියා ප්‍රඥප්තීන්ට විරුද්ධ ය. එහෙත් රුසියාවට හෝ සර්බියාවට හෝ ලංකාවට හෝ ඒ සම්බන්ධයෙන් කළ හැක්කේ කුමක් ද? රුසියාව ආරක්ෂක මණ්ඩලයෙහි දී කොසෝවෝවට විරුද්ධ ව තම නිෂේධ බලය යොදවනු ඇත. එහෙත් එපමණකින් කොසෝවෝව නැවතත් සර්බියාවේ කොටසක් බවට පත් නොවෙයි. සති තුනකට පමණ ඉහත දී සර්බියාවේ නව ජනාධිපති ලෙස නිකොලික් මහතා පරදවා බෝරිස් ටැඩික් මහතා ජයගත්තේ ය. නිකොලික් මහතා ක්‍රොඒෂියාවට විරුද්ධව යුද අපරාධ කෙළේ යැයි අධිකරණයෙන් තීන්දු කෙරුණු මිලොසෙවික් මහතාගේ ආණ්ඩුවේ ඇමතිවරයකු වූ දැඩි මතධාරියකු යැයි කියැවෙයි. කෙසේ වෙතත් ටැඩික් මහතා කොසෝවෝවට විරුද්ධව යුද්ධ ප්‍රකාශ නොකරනු ඇතැයි බලාපොරොත්තු වෙයි. නිකොලික් මහතා ජයග්‍රහණය කෙළේ නම් කොසෝවෝව වෙන ම රාජ්‍යයක් බවට ප්‍රකාශකිරීමර තිබු ඉඩ අඩුවීමට තිබුණි. එමෙන් ම යම්කිසි අයුරකින් කොසෝවෝව වෙනම රාජ්‍යයක් බවට ප්‍රකාශ කෙරුණත් නිකොලික් මහතා යටතේ තවත් බෝල්කන් යුද්ධයකට මුහුණ පෑමට ඇ එ ජනපදයට සිදුවීමට තිබුණි. ටැඩික් මහතාගේ ජයග්‍රහණය වෙනුවෙන් ඇ එ ජනපදය කළ වැඩ කොටස පිළිබඳ තවමත් එතරම් දෙයක් දැනගැනීමට නැත.

සර්බියානු ජනාධිපතිවරණය අවසන් වූ වහාම යුරෝපා සංගමය 1800 ක පමණ යුරෝපීය පොලිස් හා නීති නිලධාරීන් කණ්ඩායමක් දැනට කොසෝවෝහි සිටින එක්සත් ජාතීන්ගේ මිසමෙහි තැන ගන්නා බව ප්‍රකාශ කෙළේ ය. කොසෝවෝව රීතියා නිදහස් රාජ්‍යයක් බවට ප්‍රකාශ කෙරුණේ මේ මිසම සිටින අතර ය. එපමණක් නොවෙයි. 1998-99 කාලයෙහි දී මිලොසෙවික්ගේ සර්බියානු හමුදා කොසෝවෝවෙන් ඉවත්කරගන්නා ලෙසට බලකරමින් නේටෝ සංවිධානය විසින් දින 78ක් පුරා සර්බියාවට බෝම්බ ප්‍රහාරයක් එල්ල කරන ලදී. අවසානයේ දී හමුදා ඉවත්කරගැනීමට මිලොසෙවික් ට සිදුවීය. බෝම්බ ප්‍රහාරයෙහි දී මිය ගිය සිවිල් වැසියන් සංඛ්‍යාව ගණන්කිරීමට කුමාර් රූපසිංහ හෝ පාකියසෝති සරවනමුත්තු හෝ වෙනත් අයකු හෝ සර්බියාවේ සිටි බව වාර්තා නො වෙයි. මේ සියල්ල කෙරී ඇත්තේ එක්සත් ජාතීන්ගේ රීතියා ප්‍රඥප්තීන්ට විරුද්ධව ය. එක්සත් ජාතීන්ගේ සංවිධානය යනු ඇ එ ජනපදය එකඟවන අවස්ථාවන්හි දී රීතියා ප්‍රඥප්ති රකින එහෙත් ඇ එ ජනපදය ප්‍රඥප්ති කඩන විට කතා පමණක් පැවැත්වීමට හැකි ඇ එ ජනපදය විසින් අවසාන විග්‍රහයෙහි දී නඩත්තු කෙරෙන ඇ එ ජනපදයෙහි රූකඩ ආයතනයක් පමණකි. වෙනත් වචනවලින් කියන්නේ නම් එක්සත් ජාතීන්ගේ සංවිධානය යනු ඇ එ ජ විසින් ඇ එ ජ වෙනුවෙන් නඩත්තු කෙරෙන තවත් රූකඩ ආයතනයකි. ලංකාවේ ඇතැමුන් දෙමළ ජාතිවාදයට එරෙහිව මේ රූකඩයට පෙත්සම් යවනවිට කළ යුත්තේ සිනහසීම ද ඇඬීම ද යන්න තීරණය කිරීම නම් තරමක ගැටළුවකි.

සොසෝවෝවෙන් ලංකාවට ඉගෙනගත හැකි පාඩම් රාශියක් වෙයි. අද දෙමළ ජනයාගේ රීතියා මානව අයිතිවාසිකම් රැකීමේ මුවාවෙන් යම් ජාත්‍යන්තර හමුදාවක් ලංකාවට එවා ලංකාණ්ඩුවේ හමුදා උතුරු පළාතෙන් ඉවත්කරවීමේ වෑයමක් පවතියි. යම් අයුරකින් රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපති වූයේ නම් හමුදා ඉවත්කර ගැනීමත් නිරීක්ෂණ මිසම් (ශ්‍රී ලංකා මොනිටරින් මිෂන්) පැමිණීමත් ඒ අතරවාරයේ රීළම ප්‍රකාශකිරීමත් සිදුවීමට තිබුණි. රීතියා සටන් විරාම ගිවිසුම ඒ සඳහා තැබූ පියවරක් පමණක් විය. ඒ ගිවිසුමටත් මිසමටත් ඉන්දියාවේ අනුමැතිය ලැබී තිබුණු බව ඉන්ඩියාර්නිවීස් වෙබ් අඩවියේ පෙබරවාරි 17 වැනි දින අඩවිගත කෙරුණු ලිපියක සඳහන් වෙයි. මෙරට ජනතාව කල්පනාකාරීව ඡන්දය දී රනිල් වික්‍රමසිංහ මහතා ජනාධිපතිවරණයෙන් පරාජය කළහ. අද අප හමුවේ ඇති අභියෝගය කොටි සංවිධානයට එරෙහිව මෙහෙයුම් දිගටම කරගෙන යෑමත් මානව හිමිකම් කොන්ත්‍රාත්කරුවන්ට කිසිම ඉඩක් නො දීමත් ය. කොටුව දුම්රියපොළ ඉදිරියේ හෝ ලිප්ටන් වටරවුමේ හෝ වෙනත් තැනක හෝ සටන්පාඨ කී පමණින් විදේශීය විජාතික බලපෑම් හෝ ඔවුන්ගේ හමුදා පැමිණීම් හෝ නැවැත්විය හැකි නො වෙයි. ඒ සඳහා සැලසුම් සහගත ව උපක්‍රමශීලී ව ක්‍රියා කළ යුතු වෙයි. ඒ සැලසුම් හා උපක්‍රම දේශපාලන වේදිකාවල නොව පාර්ලිමේන්තුවේවත් සඳහන් කළ යුතු නො වෙයි.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva